ඝාතනයක් හා සම්බන්ධ වූ දිවි තොර කරගැනීම් සඳහා බොහෝ විට වඩාත් ඉහළ අවධානයක් ලැබේ. එනිසාම, එවැනි සිදුවීම් වාර්තා කිරීමේදී මාධ්‍ය වඩාත් ප්‍රවේසම් සහගත, ආචාර ධාර්මික ප්‍රවේශයක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. එසේ නැති නම්, එය අනුකාරක සිදුවීම් සඳහා මග පෑදිය හැක.

මැයි 30, 2022 දින නවගත්තේගම සිදුවූ ද්විත්ව ඝාතනයත්, අනතුරුව සිදුවූ දිවි තොර කරගැනීමත් මාධ්‍ය ඔස්සේ වාර්තා වී තිබුණි. එම පුවත් වාර්තාවන් දිවි තොර කරගැනීම් වාර්තාකරණය සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූල වී නොතිබුණේ මෙසේයි.

1) දිවි තොර කරගත් ආකාරය සඳහන් වේ. ඒ ඔස්සේ, එම ක්‍රමය අනුගමනය කරමින් සිදුවිය හැකි අනුකාරක දිවි තොර කරගැනීම් වලට පෙළඹීමක් ඇති කළ හැක.

2) උපකාරක අංක සඳහන් නොවේ. හදිසි උපකාරක අංක මෙවැනි පුවත් වාර්තාවන් සමග සඳහන් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුවක් ඇති අය උපදේශනය වෙත යොමු කොට ඔවුන්ගේ දිවි ගලවා ගැනීමේ ඉඩක් ලැබීමට හැකියාව තිබේ.

එසේ නම්, මෙම පුවත් වාර්තාවන් දිවි තොර කරගැනීම් වාර්තාකරණය සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන්ට අනුකූලව වාර්තා කිරීමේ ඉඩක් නොතිබුණිද?

(මෙම පුවත එදින සහෝදර ඉංග්‍රීසි පුවත්පත් තුළ වාර්තා වී නොතිබුණි.)

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://www.nsrf.ie/.../Briefing_Murder-suicide_NSRF_26...
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...
https://media.samaritans.org/.../Samaritans_Ireland_media...